# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

## Business Studies

නිපුණතාව 4

විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

---

# ව්‍යාපාර සංවිධාන


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : ජී. කේ. කේ. පී. කරුණාදාස මිය**
**විකිළිය නාරද මහා විද්‍යාලය**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# ව්‍යාපාර අධ්‍යයනය

**නිපුණතාව 4 :** විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** සංවිධාන සංකල්පය හඳුන්වා, හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව : 02**

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- සංවිධානයක් යන්න හඳුන්වා නිදසුන් දක්වයි.
- විධිමත් සංවිධානයක දැකිය හැකි ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර සංවිධාන යන්න අර්ථ දක්වයි.
- ව්‍යාපාර සංවිධාන ඒවායේ හිමිකාරත්වය මත වර්ග කරයි.
- පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.
- පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කොට රූප සටහනකින් දක්වයි.

## සංවිධානයක් යන්න හැඳින්වීම

පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශී වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම් ලත් සමාජ ඒකකයක්

උදා: පාසැල, පන්සල, වෙළඳසැල්

විධිමත් සංවිධානයක පොදු ලක්ෂණ

- ✶ අරමුණක් තිබීම.
- ✶ පුද්ගලයන් තිබීම.
- ✶ සංවිධාන ව්‍යුහයක් තිබීම.
- ✶ නාමයක් තිබීම.

## ව්‍යාපාර සංවිධානයක් යන්න අර්ථ දැක්වීම.


ලාභ ඉපැයීම හෝ සමාජ සුභ සාධනය අරමුණු කරගෙන භාණ්ඩ හා සේවා නිශ්පාදනය කිරීම, බෙදාහැරීම, අලෙවි කිරීම නිරත ව්‍යවසායන් ව්‍යාපාර සංවිධාන වේ.

ක්‍රියාකාරකම 01

A. ඔබ අවට ඇති, ඔබට හුරු පුරුදු, ඔබ දන්නා ව්‍යාපාරවල නම් ලැයිස්තු ගත කරන්න.

B. ඒවා පෞද්ගලික හා රාජ්‍ය අංශය යටතේ වර්ග කරන්න.

හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම.



**නිපුණතා මට්ටම 4.2 :** කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා සීමා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**ඉගෙනුම් ඵල**

- කේවල ස්වාමි ව්‍යාපාර යන්න පැහැදිලි කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරවල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී බලපාන නීති රීති පැහැදිලි කරයි.
- කෙව් ල සව් ාමි ව්‍යාපාරයක ් ලයි ාපදිංචි කරී මේ දී අනගු මනය කළ යතු ු කයි් ා පටිපාටිය විස්තර කරයි.

# කේවල ස්වාමි ව්‍යාපාර

හිමිකාරීත්වය තනි පුද්ගලයෙකු සතු වන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර වේ.

උදා: ආසිරි බේක් හවුස්

ජෝති ස්ටෝර්ස්

ගිම්සරණි පොත්හල

ජායිශා හෝටලය

## කේවල ස්වාමි ව්‍යාපාරයක ලක්ෂණ

- අයිතිකරු විසින් තනිව ප්‍රාග්ධනය සපයා ගැනීම.
- කළමණාකරණ තීරණ අයිතිකරු විසින් ගනු ලැබීම.
- අයිතිකරුගේ අසීමිත වගකීම
- ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
- ලියාපදිංචිය අනිවාර්ය නොවීම.
- ලාභ හෝ අලාභ තනිව භුක්ති විදීම.
- අවදානමට තනිව මුහුණදීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
- ගිණුම් තැබීම අනිවාර්ය නොවීම.
- ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නොවීම.

## කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකිවීම.
- සියලු ලාභ අයිතිකරු සතුවීම.
- ස්වාධීන තීරණ ගත හැකිවීම.
- බලපාන නීති රීති හා රෙගුලාසි අවම වීම.
- ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම.
- ව්‍යාපාරය පහසුවෙන් කළ හැකිවීම.
- ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පවත්වා ගත හැකිවීම.
- පාලනය පහසුවීම.

## කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි අවාසි

- අයිතිකරුවන්ගේ අසීමිත වගකීම
- ප්‍රාග්ධනය සපයා ගැනීමේ දී දුශ්කරතා මතුවීම.
- අයිතිකරු විසින්ම තීරණ ගන් ලබන නිසා ඒවා අසාර්ථක විය හැකි වීම.
- නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
- ව්‍යාපාරය පුළුල් වන විට කළමණාකරණය අපහසු වීම.
- අලාභ තනිව භුක්ති විඳීමට සිදුවීම.

පැවරුම්

ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් ව්‍යාපාරයක ලියාපදිංචියට අදාළ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය හා ව්‍යාපාර නාම ලියාපදිංචිය කිරීම සඳහා වු ග්‍රාම නිලධාරී ඉල්ලුම් පත්‍රය ලබාගෙන එය හොඳින් කියවා බලන ලෙස සිසුන්ට දැන්වීම.

ලියාපදිංචිය කළ යුතු වන්නේ අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් 1918 අංක 16 දරන ව්‍යාපාර නාම ආඥා ලනත යටතේ ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් ව්‍යාපාර නාම රෙජිස්ටාර් වෙත ලියාපදිංචිය කළ යුතුය. ප්‍රායෝගිකව ලියාපදිංචිය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කරගත හැකිය.

## ලියාපදිංචියට අදාළ ක්‍රියාපටිපාටිය

- ව්‍යාපාරය ඇරඹීමට අපේක්ෂා කරන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් කේවල ස්වාමි ව්‍යාපාරයක නාමයක් ලියාපදිංචියට අදාළ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම.
- අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වු වාර්තාව ලබා ගැනීම.
- ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව හා සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තුව ද සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම.
- ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බලා ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

**නිපුණතා මට්ටම** 4.3 : හවුල් ව්‍යාපාරයක ලක්ෂණ විමසමින් හවුල් ව්‍යාපාරවල වාසි හා සීමා විමර්ශනය කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 08
**ඉගෙනුම් ඵල** :

- හවුල් ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යන්න අර්ථ දක්වයි.
- හවුල් ව්‍යාපාරයක සුවිශේෂී ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- හවුල් ගිවිසුම යන්න පැහැදිලි කරයි.
- හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර විස්තර කරයි.
- හවුල් ඔප්පුවක වැදගත්කම අගයයි.
- හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු අනාවරණය කරයි.
- 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියේ විධිවිධාන පැහැදිලි කරයි.
- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- හවුල් ව්‍යාපාරයක වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර තුලනාත්මක ව සසඳයි.

## හවුල් ව්‍යාපාර

ලාභ ඉපැයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය හවුල් ව්‍යාපාරයක් වේ.

## හවුල් ව්‍යාපාරයක් වීමට අනිවාර්යෙන්ම තිබිය යුතු ලක්ෂණ

- පුද්ගලයන් සිටිම - හවුල්කරුවන් සංඛ්‍යාව අවමය දෙදෙනෙකුට හා උපරිමය විස්සකට සීමා විය යුතු ය.
- ව්‍යාපාර කටයුත්තක් පැවතීම - ව්‍යාපාරික මුහුණුවරක් ගත් ආර්ථික කටයුත්තක හවුල් ව්‍යාපාරයක නියුක්ත විය යුතුය.
- ලාභ ලැබීමේ අරමුණක් තිබීම - හවුල්කරුවන් අතර ලාභ බෙදා ගැනීමේ අරමුණ මත හවුල නිර්මාණය විය යුතුය.
- හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම.
- අන්‍යෝන්‍ය නියෝජ්‍යත්වය – සෑම හවුල්කරුවෙකුම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම.

## හවුල් ගිවිසුම

හවුල් ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කොට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කරගන්නා එකඟතාවය යි.

හවුල් ගිවිසුමක් ආකාර 3 කින් ඇතිවිය හැක.

- වාචිකව
- ලිඛිතව
- ව්‍යංගයෙන්

## හවුල් ඔප්පුව

හවුල්කරුවන් අතර ඇති කරගන්නා ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව නැතහොත් හවුල් ව්‍යවස්ථාවලිය ලෙස හඳුන්වයි.

## හවුල් ඔප්පුවක ඇති වැදගත්කම

- හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් බොහෝ දුරට විසඳා ගත හැකි වීම.
- හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමේ දී පහසුවක් වීම.

ක්‍රියාකාරකම 02

පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න. එක් එක් කණ්ඩායම විසින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන්නේ යැයි සිතා ඒ සඳහා සකස් කරන හවුල් ඔප්පුවක ඇතුළත් විය යුතු යැයි සිතන මූලික තොරතුරු පෙළගස්වන්න.

## හවුල් ඔප්පුවක ඇතුළත් වන කරුණු

- ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු – ව්‍යාපාරයේ නම, හවුල්කරුවන්ගේ නම හා ලිපිනයන්, හවුල් ව්‍යාපාරියේ කාල සීමාව
- ප්‍රාග්ධන යෙදීම පිළිබඳ විස්තර
- ලාභාලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
- හවුල්කරුවන්ගේ ගැනලි පිළිබඳ සීමා
- ප්‍රාග්ධන පොලී හා ගැනිලි පිළිබඳ තොරතුරු
- හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි
- අමතර ප්‍රාග්ධනය යෙදීම සම්බන්ධ කොන්දේසි
- නව හවුල්කරුවකු බඳවා බඳවා ගැනීමේ දී, සිටින හවුල්කරුවකු ඉවත්ව යාමේ දී, හවුල්කරුවකුගේ මරණයේ දී කටයුතු කරන ආකාරය

## හවුල් ආඥා පනතේ 24 වගන්තිය

හවුල් ව්‍යාපාරයකට ලිඛිත ගිවිසුමක් නොමැති විට හෝ ගිවිසුමේ නොමැති කරුණක් සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ විට 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත 24 වගන්තිය ට අනුව කටයුතු කළ යුතුය.

## හවුල් ආඥා පනතේ 24 වගන්තිය ඇතුළත් කරුණු

- ලාභ හා අලාභ හවුල්කරුවන් අතරේ සමානව බෙදාගත යුතුය. හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමානව බෙදා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
- ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පෞද්ගලිකව දරන වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතුය.
- ප්‍රාග්ධනය ට අමතරව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% ක වාර්ෂික පොලියක් හිමි වේ. ප්‍රාග්ධනය වෙනුවෙන් පොලිය හවුල්කරුවන්ට හිමි නොවේ.
- ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගිවීමට සෑම හවුල්කරුවකුට ම අයිතියක් ඇත. හවුල්කරුවන් ට තම සේවය වෙනුවෙන් වේතනයක් ලැබිය නොහැක.
- සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව නව හවුල්කරුවකු බඳවා ගත නොහැක.
- ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැන නගින සාමාන්‍ය ගැටලුවක් හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණයක් ගත හැකි අතර ව්‍යාපාර කටයුතු වල ස්වභාවය වෙනස් කිරීම වැනි කටයුතු සියලුම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් තොරව සිදු කළ නොහැක.
- ව්‍යාපාරයේ ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ පැවතිය යුතු අතර ඕනෑම අවස්ථාවක ඒවා පරීක්ෂා කිරීමට, පිටපත් කරගැනීමට සියලුම හවුල්කරුවන් ට අවසර තිබිය යුතු ය.

## හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම.

හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචිය සිදු කිරීමේ දී අනුගමනය කළ ක්‍රියා පටිපාටිය ට සමාන වේ.

# හවුල් ව්‍යාපාරයක වාසි සහ අවාසි

වාසි

- පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.
- පහසුවෙන් විසුරුවා හැරිය හැකි වීම.
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.
- කිහිපදෙනකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකි වීම.
- වගකීම කිහිපදෙනකු අතර බෙදීයාම.
- සාමූහික වගකීම නිසා ඇති වන උනන්දුව සහ කාර්යක්ෂමතාව

අවාසි

- හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.
- හවුල්කරුවන් අතර ඇතිවිය හැකි මතභේද ව්‍යාපාරයට අහිතකර ලෙස බලපෑම.
- එක් හවුල්කරුවකුගේ ක්‍රියාකලාපය නිසා සියලුම හවුල්කරුවන් වගකීමට බැඳීම.
- අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

අභ්‍යාස

1. දී ඇති නිර්ණායක අනුව කේවල ස්වාමි ව්‍යාපාරය හා හවුල් ව්‍යාපාරය තුලනාත්මකව සසඳන්න.

| නිර්ණායක | කේවල ස්වාමි ව්‍යාපාරයක | හවුල් ව්‍යාපාරය |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | | |
| ප්‍රාග්ධනය යෙදවීම | | |
| පරිපාලනය | | |
| වගකීම | | |
| ලාභලාභ භුක්ති විඳීම | | |
| තීරණ ගැනීම | | |
| ව්‍යාපාරය අවසන් කිරීම | | |

# 2019 නව නිර්දේශය

(01) ව්‍යාපාරවලට අදාල ලක්ෂණ සමහර සමහරක් පහත දැක්වේ.

A - නීතිමය අවශ්‍යතා අවම වීම.

B - අඛණ්ඩ පැවැත්ම

C - අසීමිත වගකීම

D - අන්‍යෝන්‍ය එකඟතාවය

E - ව්‍යාපාරය නමින් බඳු ගෙවීම.

ඉහත දෑ අතුරෙන් හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පමණක් අඩංගු වර්ණය කුමක්ද?

(1) ABE (2) ACD (3) BCD (4) BDE (5) CDE

(02) ලාභය අරමුණු කරගත් නමුත් ලියාපදිංචිය අනිවාර්ය නොවන ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් වන්නේ, …………………………….. හා ………………………………… ව්‍යාපාරයන් ය.

(04) බේකරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් මිල ඉහළ යාම නිසා බේකරි හිමියකු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණයේ ඇති වාසි හතරක් විස්තර කරන්න.

## 2018 AL

නිමල් හා කමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නමුත් ඔවුන් අතර හවුල් ලිඛිත ගිවිසුමක් නොතිබුණි. පසුගිය වසරේ දී ඔවුන් විසින් යෙදූ ප්‍රාග්ධනයට මෙන්ම අමතරව යෙදූ ණය මුදල්වලටද 5% ක පොළියක් ලබාගෙන ඇති අතර නිමල් තම මිතුරෙකු වූ සුනිල්ව හුදෙක් සිය කැමැත්ත මත පමණක් හවුල්කරුවකු ලෙස සම්බන්ධ කර ගන්නා ලදී. කමල් ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් තමන්ට දැනට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන බව පවසන අතර එය වැඩි කිරීමට ඉල්ලීමක් කර ඇත.

(01) ඉහත සිද්ධියේ දැක්වෙන පරිදි මෙම හවුල් ව්‍යාපාරය හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව උල්ලංඝනය කර ඇති කොන්දේසි ගණන කොපමණද?

(1) එකකි
(2) දෙකකි
(3) තුනකි
(4) හතරකි
(5) කිසිවක් නැත

(02) (අ) කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරු …………………………….. තනිව මුහුණ දෙන අතර ව්‍යාපාරයේ …………………………….. බඳු ගෙවයි.

(ආ) හවුල්කරුවන්ට ව්‍යාපාරයේ වෙළඳ කටයුතුවලට සහභාගි වීමේ ……………………………. ඇති අතර ව්‍යාපාර කටයුතුවලට උනන්දුවෙන් සහභාගි වීමේ ……………………………… ද ඇත.

(03) හවුල්කරුවන් අතර ආරවුල් හට ගැනීමට බලපානු ලබන කරුණු හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.

2017 AL

(01) ව්‍යාපාර සංවිධාන වලට සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ණයකර නිකුත් කිරීමට හැකිවීම.

B - වගකීම අසීමිත වීම.

C - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම.

D - ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය වීම.

E - ස්වාධීනව තීරණ ගැනීමට හැකිවීම.

F - මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම අනිවාර්ය වීම.

ඉහත දෑ අතුරෙන් කේවල ස්වාමි ව්‍යාපාර වලට අදාල ලක්ෂණ අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) ABC (2) ACE (3) BCE (4) BDF (5) CDF

(02) හවුල් ව්‍යාපාර සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - හවුල්කරුවන් අතර ලිඛිත ගිවිසුමක් පැවතීම අත්‍යවශ්‍ය වේ.

B - ව්‍යාපාර නාම ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචිය අත්‍යවශ්‍ය වීම.

C - නෛතික පුද්ගලභාවයක් නොමැත.

D - උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව හවුල් ගිවිසුමකට තීරණය කළ හැක.

E - හවුල් කරුවන්ගේ වගකීම අසීමිත වීම.

ඉහත දෑ අතුරෙන් හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,

(1) C පමණි.
(2) C සහ E පමණි.
(3) C, D සහ E පමණි.
(4) A, B, C, E පමණි.
(5) A, B, C, D, E සියල්ලම

(03) සනත් සහ පියල් යන දෙදෙනා ලිඛිත ගිවිසුමකින් තොරව රු.100,000 බැගින් යොදා ඖෂධ අලෙවි කිරීම සඳහා xy සහ සමාගම් නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. දී ඇති තොරතුරු පදනම් කරගෙන ආරම්භ කිරීමට යන මෙම හවුල් ව්‍යාපාරයට ආදළ මූලික නෛතික පනත් හතරක් සඳහන් කර ඒවා අදාළ වන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

2016 AL

(01) 2007 අංක 7 දරණ දරන සමාගම් පනතේහි සඳහන් වන හවුල් ව්‍යාපාර වලට අදාල කරුණක් වන්නේ,
  (1) හවුල්කරුවන්ගේ ආරවුල් බේරුම් කිරීම.
  (2) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනයයි.
  (3) හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමයි.
  (4) හවුල්කරුවන් සංඛ්‍යාවයි.
  (5) හවුල් ව්‍යාපාර විසුරුවා හැරීමයි.

(02) හවුල් ව්‍යාපාරයක් ලිඛිතව හෝ ……………………………..හෝ …………………….
ඇතිකර ගත හැකිය.

(03) පුද්ගලයකු තම දියණියගේ නම යොදාගනිමින් "යශෝධා කේටරින් සර්විස් " නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා අදාළ නීතිමය විධිවිධාන කුමක්ද?

(04) හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට වඩා කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීම යෝග්‍ය පුද්ගලයකු අදහස් කරයි. මෙම අදහසට එකඟ වීම සඳහා හේතු දෙකක් දක්වන්න.

**නිපුණතා මට්ටම 4.4 :** විවිධ වර්ගයේ සංස්ථාපිත සමාගම් හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ සන්සන්දනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 10

**ඉගෙනුම් ඵල**

- සංස්ථාපිත සමාගම් අර්ථ දක්වයි.
- සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- සීමාසහිත සමාගම්වල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- සමාගමක් ලියාපදිංචි කිරීමේ දී භාවිත වන ලියවිලි පැහැදිලි කරයි.
- සංස්ථාපිත සමාගම් වර්ග කරයි.
- එක් එක් සමාගම් වර්ගයේ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- එක් එක් සමාගම් වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- සංස්ථාපිත සමාගම් වර්ග සැසඳීමේ නිර්ණායක පැහැදිලි කරයි.
- නිර්ණායක පදනම් කරගෙන සංස්ථාපිත සමාගම් වර්ග සසඳයි.
- දෙන ලද ව්‍යාපාරවල නාමය අනුව එය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නිවැරදි ව ප්‍රකාශ කරයි.

## සංස්ථාපිත සමාගම්

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද පුද්ගලයන්ගේ එකතුවක් සමාගමක් ලෙස හඳුන්වයි.

## සංස්ථාපිත සමාගම් වල ලක්ෂණ

- සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයක් වීම.
- සමාගමක් එහි සාමාජිකයන් ගෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම.
- අඛණ්ඩ පැවැත්ම (නිත්‍ය සන්තතික හැකියාව) තිබීම.
- අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම.
- කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සම්පාදනය කරගැනීම.
- කොටස් පැවරීමේ හැකියාව
- කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වීම.

## සංස්ථාපිත සමාගම් වල වාසි

- විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.
- මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම.
- දක්ෂ කළමනාකරුවන් බඳවාගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකි වීම.
- කොටස්කරුවන්ගේ වගකීම සීමිත වීම නිසා ආයෝජකයින් ආකර්ශනය කර ගත හැකි වීම.
- කොටස්කරුවකු ගේ මරණය හා ඉවත් වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නොවීම.
- ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කර ගත හැකි වීම.
- ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් තිබීම.

## සංස්ථාපිත සමාගම් වල සීමා

- නීතිමය බලපෑම දැඩිවීම.
- ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම හා ඒ සඳහා පිරිවැයක් දැරිය යුතු වීම.
- කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවීම නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නොවීම.
- සමාගමේ ලාභය මත මෙන්ම කොටස්කරුවන්ට හිමිවන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදුවීම නිසා ලාභය ද්විත්ව බදු ගණනයට හසු වීම.
- විසුරුවා හැරීමක දී වුව ද සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදුවීම.

## සමාගමත් සංස්ථාපනය කිරීම

සමාගම් සංස්ථාපනය කිරීම අදාළ රටේ සමාගම් පනත යටතේ සිදු කරයි.

ශ්‍රී ලංකාවේ සමාගම සංස්ථාපනය කරනුයේ 2007 අංක 7 දරණ දරණ සමාගම් පනතට අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසිනි.

## සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියා පටිපාටිය

මේ සඳහා පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

- සමාගමේ යෝජිත නම දැනට පවත්නා සමාගමක නාමයට අනුරූප නොවන හෝ සමාන නොවන බවට ප්‍රකාශයක්
- සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍රය
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
- සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස  ක්‍රියාකිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය
- සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට කැමති බවට ආරම්භක ලේකම්වරයා ගේ ප්‍රකාශය


## සාංගමික ව්‍යවස්ථාවලිය

සමාගමේ පරමාර්ථ, සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම්, සමාගම කළමනාකරණය හා පරිපාලනය සම්බන්ධ කරුණු ඇතුළත් කර සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු ලියවිල්ල

## සංස්ථාපන සහතිකය

සංස්ථාපනයට අදාල ලියවිලි නිවැරදි බවට තහවුරු වූ පසු හා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව සමාගමක් ලෙස ලියාපදිංචි කර බවට සහතික කරමින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම වෙත නිකුත් කරනු ලබන සහතිකයයි. මෙය සම්මුති සහතිකය, සංස්ථාගත සහතික යන නම් වලින්ද හඳුන්වයි.

## සංස්ථාපිත සමාගම් වර්ග




## සීමාසහිත සමාගම්

කොටස්කරුවන් මිලදී ගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමා වන සමාගම් ය. මේවා වර්ග තුනකි.

- ✶ සී/ස පෞද්ගලික සමාගම්
- ✶ සී/ස පොදු සමාගම්
- ✶ සී/ස අක්වෙරළ සමාගම්

## සී/ස පෞද්ගලික සමාගම

කොටස් හෝ වෙනස් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නොමැති අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමය 50 ක් වන සමාගම් ය.

## සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ

- කොටස්කරුවන් අවමය 01ක් වන අතර උපරිමය 50ක් වේ. මෙම උපරිම ප්‍රමාණයට සමාගමේ සේවකයන් වන කොටස්කරුවන් අයත් නො වේ.
- අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව 01කි.
- සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීම කළ නොහැක.
- ණය ගෙවීමේ හැකියාව පිළිබඳව පරීක්ෂණයකින් තොරව සියලුම කොටස් කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදිය හැකි ය.

## සී/ ස පොදු සමාගම්

කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ මහජනයාට නිකුත් කිරීමට අවසර ඇති අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමයේ සීමාවක් නොමැති සමාගම් ය.

## සී/ස පොදු සමාගමක ලක්ෂණ

- අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් වීම හා උපරිමයේ සීමාවක් නොමැති වීම.
- අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව දෙකක් වීම.
- කොටස් හා වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම.
- කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු වීම.

## සී/ ස පොදු සමාගම් වර්ග දෙකකි.

### 01. ලැයිස්තුගත පොදු සමාගම් (මිල කළ සමාගම්)

කොටස් වෙළඳපොලේ සිය කොටස් අලෙවි කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වු පොදු සමාගම් මිල කළ සමාගම් ලෙස හඳුන්වයි.

උදා: DFCC bank PLC

සෙලින්කෝ පී එල් සී

### 02. ලැයිස්තුගත නොවූ පොදු සමාගම් (මිල නොකල සමාගම්)

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොවූ පොදු සමාගම් එනම් කොළඹ කොටස් වෙළඳපොලේ සිය කොටස් අලෙවි කිරීම සඳහා අවස්ථාව නොමැති සමාගම් ය.

උදා: සී/ස මැලිබන් බිස්කට් සමාගම

## සී/ ස අක්වෙරළ සමාගම්

යම් රටක සමාගමක් ලෙස සංස්ථාපනය කර එම රටින් පිටත ව්‍යාපාරික කටයුතු සිදු කරන සමාගම් අක්වෙරළ සමාගම් ලෙස හඳුන්වයි. මෙම සමාගම් ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන රටේ සමාගම් පනතට අනුව ද ලියාපදිංචි කළ යුතු වේ.

## සී/රහිත සමාගම්

කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වන එනම් සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස්වලට වටිනාකම ඔවුන්ගේ වගකීම සීමා නොවන සමාගම් වේ.

## ඇපයෙන් සීමිත සමාගම්

කොටස් නිකුත් කිරීමක් සිදු නොකරන, සාමාජිකයන්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමට සීමා වන සමාගම් ය.

උදා: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (ඇපකාර සමාගම)

## ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ

- කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
- සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම.
- අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකු සිටිය යුතු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නොවීම.
- පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම.
- සමාගමේ ලාභ බෙදා හැරීමක් නොකිරීම.

## විදේශීය සමාගම්

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානය පිහිටුවා ඇති නමුත් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් වේ.

මෙවැනි සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මාසයක් තුළදී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමාගම පිළිබඳ පරීක්ෂා කර එය විදේශීය සමාගමක් ලෙස ලියාපදිංචි කළ හැකි නම් විදේශීය සමාගම් ලේඛනයේ නම් ඇතුළත් කරයි.

උදා: හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකින් කෝපරේෂන්

ක්‍රියාකාරකම 03

පහත දැක්වෙන නිර්ණායක යටතේ සීමිත පෞද්ගලික සමාගමක් හා සීමිත පොදු සමාගමත් සංසන්දනය කරන්න.

| නිර්ණායක | සීමිත පෞද්ගලික සමාගම | සීමිත පොදු සමාගම |
|---|---|---|
| සාමාජික සංඛ්‍යාව | | |
| වගකීම | | |
| ප්‍රාග්ධනය සම්පාදනය | | |
| පරිපාලනය හා කළමණාකරණය | | |

## සමාගමක නම සටහන් කිරීම

## සී/ ස පෞද්ගලික සමාගමක

සමාගමේ නම මුලට ‘‘සීමාසහිත’’ යන වචනය හෝ එහි කෙටි යෙදුම වන ‘‘සී/ස’’ යන පදය සමඟ අගට යෙදෙන ‘‘සමාගම’’ යන වචනය ට පෙර ‘‘පෞද්ගලික’’ යන පදය හෝ එහි කෙටි යෙදුම ‘‘පෞද් ’’ යන්න යෙදිය යුතු ය.

උදා: සීමාසහිත සඳ ලංකා (පෞද්ගලික) සමාගම

සී/ස සඳ ලංකා (පෞද්) සමාගම

## ලැයිස්තුගත පොදු සමාගම

සමාගමේ නමේ මුලට ‘‘සීමාසහිත’’ යන වචනය හෝ එහි කෙටි යෙදුම වන ‘‘සී/ස’’ පදය සමඟ අගට යෙදෙන ‘‘සමාගම’’ යන වචනය ට පෙර ‘‘පොදු’’ හෝ ‘‘PLC’’ යන වචනය යෙදිය යුතු ය.

උදා: සී/ස සඳ ලංකා පොදු සමාගම

සී/ස සඳ ලංකා PLC සමාගම

## ලැයිස්තු ගත නොවූ පොදු සමාගම්

නමේ මුලට "සීමාසහිත" යන වචනය හෝ එහි කෙටි යෙදුම වන "සී/ස" යන පදය යෙදිය යුතු ය.

උදා: සී/ස සඳ ලංකා සමාගම

**ඇපකාර සමාගම - කොළඹ ව්‍යාපාර වස්තු (ඇපකාර සමාගම)**

**අක්වෙරළ සමාගම - ඒෂියා පැසිෆික් සමාගම**

- පාසලට එන අතරමග දී හෝ ඔබ අසා ඇති ව්‍යාපාරවල නාම කිහිපයක් ලියන ලෙස දැන්වීම.
- ව්‍යාපාර නාමය අනුව එම ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය උපකල්පනය කරන ලෙස දැන්වීම.

2019 AL

(01) පහත වගුවේ සමාගම් වර්ගය හා එම සමාගම් වල ලක්ෂණ කිහිපයක් දැක්වේ.

| සමාගම් වර්ගය | ලක්ෂණ |
|---|---|
| සී/ස පෞද්ගලික සමාගම | A - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම. |
| සී/ස පොදු සමාගම් | B - ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර විදේශයන්හි පමණක් ව්‍යාපාර කටයුතු කිරීම. |
| ඇපයෙන් සීමිත සමාගම් | C - කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වීම. |
| සීමා රහිත සමාගම් | D - ලාභ බෙදා හැරීමක් නොකිරීම. |
| අක්වෙරළ සමාගම් | E - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම. |

(01) ඉහත දී ඇති සමාගම් වර්ග අනුපිළිවෙල අනුව සමාගම් වල ලක්ෂණ නිවැරදිව ගලපා ඇති වරණය කුමක් ද?

(1) C,A,D,E,B
(2) C,D,A,B,E
(3) D,E,B,C,A
(4) E,A,D,C,B
(5) E,C,D,A,B

2018 AL

(02) ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණයක් නොවන්නේ,

(1) මහ ජනතාවට කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
(2) අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනකුවත් සිටීම.
(3) ලාභාංශ බෙදා හැරීමක් සිදු නොකිරීම.
(4) ලාභ අභිප්‍රායෙන් ආරම්භ කිරීම.
(5) සමාගම ඇවර කිරීමේදී එක් එක් සාමාජිකයා දායක විය යුතු මුදල සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කිරීම.

2017 AL

(03) සීමා සහිත පොදු සමාගමක ලක්ෂණයක් නොවන්නේ,

(1) උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව පිළිබඳ සීමාවක් නොමැති වීම.
(2) අධ්‍යක්ෂකවරුගේ උපරිම සංඛ්‍යාවක් නොමැති වීම.
(3) කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම අනිවාර්යය වීමයි
(4) ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර ණය ගෙවීමේ හැකියාව (නුබුන්වත් බව) පරීක්ෂා කළ යුතු වීම යි.
(5) කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට හැකි වීමයි.

2016 AL

(04)සමාගම් විසින් තම ………………………………. මත මෙන්ම කොටස්කරුවන්ට හිමිවන ………………………………… මත ද ආදායම් බදු ගෙවීම ද්විත්ව බදුකරණය නමින් හඳුන්වයි.

(035සීමිත පොදු සමාගමක් හා සැසඳීමේ දී සීමිත පෞද්ගලික සමාගමක ඇති අවාසි දෙකක් සඳහන් කරන්න.

**නිපුණතා මට්ටම 4.5 :** සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ විමසමින් එහි ප්‍රවණතා විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- සමුපකාර ව්‍යාපාරය අර්ථ දක්වයි.
- සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- සමුපකාර ප්‍රතිපත්ති අනාවරණය කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ වාසි හා සීමා ලැයිස්තුගත කරයි.
- සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා ලැයිස්තුගත කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

# සමුපකාර

ජාත්‍යන්තර සමුපකාර සංවිධානය, සමුපකාර ව්‍යාපාරය පහත පරිදි හඳුන්වා ඇත.

"සිය ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකමය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වේච්ඡාවෙන් ම එක්සත් වූ පුද්ගලයින්ගේ ස්වාධීන සංගමයක් මෙන් ම සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යාපාරයකි."

නිද: සී/ස රත්නපුර විවිධ සේවා සමූපකාර සමිතිය

ස/ස ධීවර සමුපකාර සමිතිය

## සමූපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ

- ස්වාධීන සංවිධානයක් වීම.
- ස්වේච්ඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම.
- සාමාජිකයින්ගේ සාමූහික අයිතිය
- පොදු අවශ්‍යතා හා අපේක්ෂා වලින් යුතු වීම.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම.
- කොටස් වල අගය වෙනස් නොවී පැවතීම. (කොටසක අගය රුපියල් 100)
- එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වීම.
- උපයන අතිරික්තය සාමාජිකයා සමිතිය සමඟ කළ ගනුදෙනු වල වටිනාකම අනුව සාමාජිකයින්ට ලබා දීම.
- ලාභය මූලික අරමුණ නොවීම.

## සමුපකාර ප්‍රතිපත්ති

- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය
- සාමාජික ආර්ථික සහභාගිත්වය
- ස්වෛරීභාවය හා නිදහස
- සමූපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු ලබා දීම.
- ප්‍රාදේශීය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාව
- සමාජය පිළිබඳ සැලකිලිමත් වීම.

## සමූපකාර ව්‍යාපාරයේ වාසි

- සමූපකාර සමිතියක් ඇරඹීම පහසු වීම - පුද්ගලයන් 10 දෙනෙකු එකතු වී අඩු මුදලකින් පහසුවෙන් ඇරඹිය හැක.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.
- අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම.
- විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම.
- එවන්නේ සහයෝගයෙන් කටයුතු කිරීම
- සමිතිය උපයන අතිරික්තය සාමාජිකයන් සතු කිරීම හෙවත් අනුග්‍රාහක ප්‍රති ගෙවීම.

## සමුපකාර ව්‍යාපාරයේ සීමාරුඅවාසි

- මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම.
- සමුපකාර ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීමට සිදුවීම.
- සීමිත කාලයක් පමණක් විවෘත ව පැවතීම.
- රාජ්‍ය අංශයේ මැදිහත්වීම සිදු වීම.
- ණයට භාණ්ඩ අලෙවියක් සිදු නොවීම.
- කළමනාකරණ මණ්ඩලය ඡන්දයෙන් තෝරා පත් වන නිසා බොහෝ විට කාර්යක්ෂම නොවීම.

## සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මගින් අදාළ පළාත් සභාවේ සමූපකාර සංවර්ධන කොමසාරිස් යටතේ සිදු කෙරේ.

වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයෙන් 10දෙනෙකුට සමිතියක් ඇරඹිය හැකි ය.

## සමුපකාර සමිතිය ලියාපදිංචියට ඉදිරිපත් කළයුතු ලියවිලි

- අයදුම් පත්‍රය
- අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
- යෝජිත ආර්ථික කටයුතු වල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
- සමුපකාර සමිතියලියාපදිංචිය සඳහා වූ යෝජනාව සම්මත වූ මහා සභා රැස්වීමේ වාර්තාව
- ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින්ගේ සාමාජික ගාස්තු ගෙවන ලද බවටත් එකී මුදල් කාරක සභාවේ භාරකාරත්වයෙ හි පවතින බවටත් කාරක සභාවේ සහතිකයක්
- සමිතිය පිහිටි ලිපිනයට ළඟාවිය ළඟාවිය හැකි මාර්ගය දක්වන සටහනක්

ඉහත ලියවිලි සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා පරික්ෂා කිරීමෙන් අනතුරුව ලියාපදිංචි සහතිකය නිකුත් කරයි.

## සමුපකාර ව්‍යාපාරයේ නව ප්‍රවණතා

- ස්වයං සේවා වෙළඳසැල් ඇරඹීම හා වෙළඳසැල් නවීකරණය කිරීම.

  උදා: කෝප්සිටි, කෝප් සුපර්

- නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම

  උදා: ඉන්ධන පිරවුම්හල්, සමුපකාර රක්ෂණය

- ජංගම වෙළඳපොළවල් ඇරඹීම.
- විද්‍යුත් ගෙවීමේ ක්‍රම භාවිතා කිරීම.

## සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා ගත හැකි යෝජනා

- විවෘතව තබන වේලාවන් දීර්ඝ කිරීම.
- ණයට භාණ්ඩ අලෙවි කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම.
- කළමණාකරණ මණ්ඩලය සඳහා දක්ෂ පළපුරුදු කාර්යක්ෂම පිරිසක් තෝරා ගැනීම.
- විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කිරීම.
- ස්වයං සේවා වෙළඳසැල් තවදුරටත් ව්‍යාප්ත කිරීම.
- පාරිභෝගික ආරක්ෂණය සඳහා වෙළඳ සැල දර්ශනීය ලෙස සකස් කිරීම.
- සාමාජික ප්‍රතිලාභ වැඩි කිරීම.
- නව සාමාජිකයන් බඳවා ගැනීමට වැඩපිළිවෙළක් සැකසීම.
- පාරිභෝගික සේවා සැපයීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම.

2018 AL

(01) සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවන්නේ,

(1) අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
(2) යෝජිත ආර්ථික කටයුතු වල යෝග්‍යතා වාර්තාව
(3) යෝජනා සම්මත වූ වාර්ෂික මහා මහා සභා වාර්තාව
(4) සමිතිය පිහිටි ස්ථානයට ළඟා වන මාර්ග සිතියම
(5) ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින්ගේ පෞද්ගලික තොරතුරු

2017ÄL

(02) ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි අඳුනාගත හැකි ගැටලු දෙකක් සඳහන් කරන්න.

2016 AL

(03) පහත දක්වා ඇත්තේ සමුපකාර ව්‍යාපෘතිය හා සම්බන්ධ කරුණු කිහිපයකි.

A - ප්‍රජාතන්ත්‍රවාදී සාමාජික පාලනය

B - රජය පිළිබඳ සැලකිලිමත් වීම.

C - සමුපකාර අධ්‍යාපනය, පුහුණුව හා තොරතුරු ලබා දීම.

D - භාණ්ඩ හා සේවා  අඩු මිලට විකිණීම.

E - ස්වෛරීභාවය හා නිදහස

F - විවිධ ක්ෂේත්‍ර වල ව්‍යාපාර කටයුතුවල නිරත වීම.

ඉහත දෑ අතුරෙන් සමූපකාර ප්‍රතිපත්ති පමණක් ඇතුළත් කාර්යය කුමක්ද?

(1) A,B,C (2) A,B,E
(3) A,C,E (4) A,C,F
(5) B,D,E

(04)සමූපකාර ව්‍යාපාරය ජනතාව අතර ජනප්‍රිය කරලීම සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා හතරක් පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම 4.6 :** විශේෂිත ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා සීමා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 08

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- වරලත් ව්‍යාපාර හඳුන්වයි.
- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශ්ව පෙන්වා දෙයි.
- වරලත්හිමියා හා වරලත්ලාභියා අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විස්තර කරයි.
- වරලත්හිමියා වරලත්ලාභියාට සපයන පහසුකම් ලැයිස්තුගත කරයි.
- වරලත් ව්‍යාපාර වර්ග කරයි.
- වරලත් ව්‍යාපාරවල වාසි හා සීමා පෙන්වා දෙයි.
- වරලත් ව්‍යාපාර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර සංයෝජනය වන ආකාරය පැහැදිලි කරයි.

# වරලත් ව්‍යාපාර

## හැඳින්වීම

කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක් එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව දීමට යොදා ගන්නා ව්‍යාපාර සංවිධාන ක්‍රමයකි.

## වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශව

වරලත් හිමියා - වරලත් සමාගමේ වෙළඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට වෙනත් ව්‍යාපාර වලට අවසර ලබා දෙන සමාගම

වරලත් ලාභියා - වරලත් සමාගමෙන් අවසර ලබාගත් ආයතනය

නිදසුන්

| වරලත් හිමියා | වරලත් ලාභියා |
|---|---|
| MC Donalds | සී/ස අබාන්ස් රෙස්ටුරන්ස් (පෞද්) සමාගම |
| KFC | කාර්ගිල්ස් සිලොන් ලිමිටඩ් |
| Pitza  Hut | ගැමා පියාක්‍රාෆ්ට් ලංකා (පෞද්) සමාගම |

## වරලත් ගිවිසුම

වරලත් ව්‍යාපාරය ආරම්භ කිරීමේදී වරලත් ලාභියා හා වරලත් හිමියා අතර ඇති වන ගිවිසුම වේ.

මෙම ගිවිසුම මගින් වරලත් හිමියාගේ ව්‍යාපාර නාමය වෙළඳ ලකුණු සහ ලාංඡනය භාවිතා කිරීමට වරලත් ලාභියාට අවසර ලැබේ.

ව්‍යාපාරය පවත්වාගෙන යාමට අදාල නීති රීති, වරලත් හිමියා විසින් සපයන සේවා සහ මූල්‍ය කොන්දේසි, වරලත්ලාභියා විසින් ගෙවිය යුතු මූලික ගාස්තුව හා මාසිකව ගෙවිය යුතු ප්‍රස්කාර සඳහන් වේ.

## වරලත් හිමියා විසින් වරලත්ලාභියාට සපයන පහසුකම්

- සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම.
- කළමනාකරණ පුහුණුව ලබාදීම.
- අලෙවිකරණ සහාය ලබාදීම.
- මූල්‍ය පහසුකම් ලබා දීම.
- වෙළඳසැලේ නිමාව සකස් කර දීම.
- නිෂ්පාදිතය හෙවත් භාණ්ඩ හා උපකරණ සැපයීම.
- ශිල්පීය ඥානය ලබාදීම.

වරලත්ලාභියා විසින් ඉටු කළ යුතු කාර්යයන්

- වරලත්හිමියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟවීම.
- ප්‍රාග්ධනය ආයෝජනය කිරීම.
- වරලත් හිමියාගෙන් හෝ ඔහු විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් පමණක් භාණ්ඩ මිලදී ගැනීම.
- වරලත් හිමියාට ගිවිසගත් පරිදි ගාස්තු ගෙවීම.

## වරලත් ව්‍යාපාර වර්ග

**නිෂ්පාදිත වරලත් ව්‍යාපාර** - වරලත් හිමියාගේ වෙළෙඳ ලකුණු භාණ්ඩ ඔහුගෙන් මිලට ගෙන නැවත විකිණීමට වරලත්ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර

නිද: ඛනිජ තෙල් විකිණීමේ අලෙවිසැල (IOC ඉන්ධන පිරවුම්හල)

**නිෂ්පාදන වරලත් ව්‍යාපාර** - වරලත් හිමියාගේ වෙළඳ ලකුණු යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර

නිද: කොකා කෝලා, පෙප්සි කෝලා වැනි සිසිල් බීම

**ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර**

වරලත් හිමියාගේ නමින් හා ක්‍රමය යටතේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට වරලත් ලාභියාට අයිතියට පැවරෙන වරලත් ව්‍යාපාර

උදා: MC Donalds, KFC, Pittza Hut

## වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි

**වරලත් හිමියාට** -

- ඔහුගේ ම ආයෝජනයකින් තොරව ව්‍යාපාරය පුළුල් කිරීමට හැකියාව ලැබීම.
- ප්‍රචාරණ වියදම් වරලත් ලාභියා සමඟ බෙදා ගත හැකි වීම.
- වරලත් ලාභියාගේ ආයෝජනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වීම
- වරලත් ලාභියාගේ කාර්යක්ෂමතාව මත නිරායාසයෙන් ම ප්‍රතිලාභ ලැබිය හැකි වීම.
- වරලත් ලාභියා මගින් පෝෂණය වීම.

**වරලත් ලාභියා** -

- වරලත් හිමියාගේ කීර්තිනාමය මත විශාල වෙළඳ පොළක් ලබා ගත හැකි වීම.
- අසාර්ථක වීමේ ප්‍රවණතාව අඩු වීම.
- ජනප්‍රිය වෙළෙඳ නාමය නිසා ප්‍රචාරණය පහසු වීම.
- වරලත් හිමියාගෙන් කළමනාකරණ පුහුණුව ලැබීම.
- වරලත් හිමියාගෙන් මූල්‍ය පහසුකම් ලැබීම.
- අමුද්‍රව්‍යය අවම මිලකට ලබා ගත හැකි වීම.

## වරලත් ව්‍යාපාර වල අවාසි

**වරලත් හිමියාට** -

- වරලත් ලාභීන් අසාර්ථක වීමෙන් ලාභ අඩු විය හැකි වීම.
- වරලත් ලාභියාගේ අහිතකර ක්‍රියාකලාප වරලත් හිමියාගේ කීර්ති නාමය කෙරෙහි බලපෑ හැකි වීම.
- වරලත් ලාභීන් උපයන ලාභයෙන් වැඩි කොටසක් ඔවුන් විසින් ම රඳවා ගැනීම.

**වරලත්ලාභියාට** -

- වරලත් හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් හිමි නොවීම.
- වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.
- ලාභය පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතිය හැකි වීම.
- වරලත් හිමියාගේ කීර්ති නාමය මත රඳෙන නිසා ආයෝජනය පිළිබඳ අවදානමක් පැවතීම.
- වරලත් ගිවිසුමට අනුව කටයුතු කිරීමට සිදුවෙන නිසා වරලත්ලාභියා දැඩි පීඩනයකට හසු වීම.

# ව්‍යාපාර සංයෝජන

සමාගම් දෙකක් හෝ කිහිපයක් එකට එකතු වී කටයුතු කිරීම ව්‍යාපාර සංයෝජන ලෙස හඳුන්වයි. මෙසේ ව්‍යාපාර සංයෝජනය වී කටයුතු කිරීම ව්‍යාපාර ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවකි.

ව්‍යාපාර සංයෝජනය වීම ආකාර දෙකකි.

1. ඒකාබද්ධ වීම
2. අත්පත් කර ගැනීම

## ඒකාබද්ධ වීම

වෙන් වෙන්ව පැවැති සමාගම් දෙකක් හෝ කිහිපයක් තනි ව්‍යාපාරයක් බවට පත් වීම. මෙහි දී එක් සමාගමක් අනෙක් සමාගමේ වත්කම් හා වගකීම් වලට මිලට ගැනීම හෝ සංයෝජනය වන සමාගම් වල පැවති ව්‍යාපාර කටයුතු නිම කර ඒ අනුව නව සමාගමක් පිහිටුවීමක් කළ හැකිය.

## අත්පත් කර ගැනීම

එක් සමාගමක් විසින් අනෙක් සමාගමේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් මිලට ගැනීම සිදු වේ. කොටස් මිලට ගන්නා සමාගමට පාලන බලය හිමි වේ.

ඒකාබද්ධ වීම් හෝ අත්පත් කර ගැනීම් මගින් ඇති වන සංයෝජන ප්‍රධාන වර්ග තුනකි.

1. තිරස් අයෝජන
2. සිරස් සංයෝජන
3. විෂම සංයෝජන

**තිරස් ආයෝජන -**

එක සමාන ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින සමාගම් දෙකක් හෝ කිහිපයක් කිහිපයක් ඒකාබද්ධ වීම.

නිද: සපත්තු නිශ්පාදන ආයතන දෙක සංයෝජනය වීම.

යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් සමාගම හා ඒෂියන් එලායන්ස් ජෙනරල් සමාගම ඒකාබද්ධව ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම පිහිටුවීම.

**සිරස් ආයෝජන -**


කිසියම් නිෂ්පාදිතයක විවිධ අවස්ථාවල යෙදී සිටින සමාගම් කිහිපයක් ඒකාබද්ධ වීම.

නිද: සපත්තු නිශ්පාදන සමාගමක්, සම් නිෂ්පාදනය කරන සමාගමක් හා සපත්තු අලෙවි කරන සමාගමක් සංයෝජනය වීම.

**විෂම සංයෝජන -**

එක සමාන නොවන වෙනස් වර්ගවල ව්‍යාපාර සංයෝජනය වීම.

නිද: සපත්තු නිෂ්පාදන සමාගමක් බිස්කට් නිෂ්පාදන සමාගමක් සමග සංයෝජනය වීම.




1.සිරස් සංයෝජන

2.තිරස් සංයෝජන

3.විෂම සංයෝජන

2019 AL

පහත වගුවේ ව්‍යාපාර ඒකාබද්ධ වීමේ උපාය මාර්ග සහ අදාල විස්තර කීපයක් දැක්වේ.

| ඒකාබද්ධ වීමේ උපාය මාර්ග | විස්තරය |
|---|---|
| තිරස් | A - වෙනත් කර්මාන්තයක ආයතන සමඟ ඒකාබද්ධ වීම. |
| සිරස් පසුපසට | B - එකම කර්මාන්තය ආයතන සමඟ ඒකාබද්ධ වීම. |
| විෂම | C - පූර්වයෙන් බෙදාහරින්නන් ලෙස කටයුතු කළ ආයතන සමඟ ඒකාබද්ධ වීම. |
| සිරස් ඉදිරිපසට | D - පූර්වයෙන් සැපයුම්කරුවන් ලෙස කටයුතු කළ ආයතන සමඟ ඒකාබද්ධ වීම. |

වරලත්ලාභියා විසින් දළ ................................... වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස වරලත්හිමියා වෙත ගෙවිය යුතු වන්නේ ................................ වේ.

2018

වරලත් හිමියාට මෙන්ම වරලත්ලාභියාට ද ඉටුකළ යුතු කාර්යය සමූහයක් පවතී. වරලත් ලාභියෙකු විසින් ඉටු කළ යුතු කාර්යයන් හතරක් කෙටියෙන් විස්තර කරන්න.

2017

වරලත් හිමියෙකු විසින් වරලත්ලාභියෙකු තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු 4 ක් ලියන්න.

2016

(01) වරලත් ව්‍යාපාරයක් තුලින් වරලත් ලාභියෙකුට අත්වන වාසියක් වන්නේ,

(1) ආයෝජනය පිළිබඳ අවදානමක් නොමැති වීම ය.
(2) ලාභය නිශ්චිතවීමයි.
(3) අඩු පිරිවැයකින් වරලත් ව්‍යාපාර බලපත්‍රය ලබා ගැනීමට හැකි වීම.
(4) ස්වාධීනව තම ව්‍යාපාර කටයුතු කිරීමට හැකි වීමයි.
(5) වරලත් හිමියාගේ පුහුණුව හා උපදෙස් ලබා ගැනීමට හැකි වීමයි.

**නිපුණතා මට්ටම 4.7 :** රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාරවල වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 04

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වා ගෙන යාමට හේතු විමසයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසයි.

## රාජ්‍ය අංශයේ ව්‍යාපාර

හැඳින්වීම - රජය හෝ පළාත් පාලන ආයතනයක් විසින් පවත්වාගෙන යන හා පාලනය කරන සියලුම ව්‍යාපාර රාජ්‍ය අංශයේ නැතහොත් පොදු අංශයේ ව්‍යාපාර ලෙස සලකයි.

පොදු ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා රාජ්‍ය අංශය මගින් ව්‍යාපාර පවත්වාගෙන යයි.

රාජ්‍ය අංශය අංශයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හේතු

- පෞද්ගලික අංශය විසින් අහිතකර ලෙස ලාභ ඉපැයීම වැනි වෙළෙඳපල තත්ත්වය පාලනය කිරීමට
- ඒකාධිකාරි ආයතන බිහි වීම වැළැක්වීමට
- ජාතියේ ආරක්ෂාව වෙනුවෙන් පවතින යම් යම් ව්‍යාපාර ක්ෂේත්‍ර පවත්වාගෙන යාමට
- පොදු ජනතාවට සාධාරණ මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට
- රජයේ සැලැස්මක් හා පාලනයක් යටතේ ව්‍යාපාර කටයුතු සිදු වන බැවින් සම්පත් නාස්තිය අවම කර ගැනීමට
- ලාභ නොමැති, පෞද්ගලික අංශය අත නොගසන වැදගත් මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රම පවත්වාගෙන යාමට

## රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග

- රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
- රජයේ දෙපාර්තමේන්තු
- රාජ්‍ය සමාගම්
- පළාත් සභා හා පළාත් පාලන ආයතන යටතේ ඇති ව්‍යාපාර

## රාජ්‍ය සංස්ථාවක ලක්ෂණ

- විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම.
- නෛතික පුද්ගල භාවයක් හිමි වීම.
- පූර්ණ අයිතිය හෝ වැඩි අයිතිය රජය සතු වීම.
- රාජ්‍ය ණය රජය විසින් පත්කරන අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය කිරීම.
- රාජ්‍ය ණය ලාභාංශ ප්‍රති ආයෝජනය මහජනතාව ණය ප්‍රාග්ධනයට දායක කර ගැනීම ආදිය මගින් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම.
- අවම මිලකට ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම ප්‍රධාන අරමුණ වීම.

නිද: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

රාජ්‍ය සංස්ථාවක් මණ්ඩලය, අධිකාරිය, කාර්යාංශය, සභාව, ආයතන ආදී විවිධ නම් වලින් හඳුන්වයි.

## රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ

- අමාත්‍යාංශයක් යටතේ රජයේ සෘජු පාලනයට යටත් වීම.
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි ආදී රජයේ ප්‍රතිපත්ති වලට අනුව ම කටයුතු කළ යුතු වීම.
- බොහෝ විට සේවා සැපයීමේ නිරත ආයතන වීම.
- නීතිමය පුද්ගල භාවයක් නොමැති නමුත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල නාමයෙන් නීතිය ඉදිරියේ පෙනී සිටිය යුතු වීම.
- රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කිරීම.

නිද: අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුව

## රාජ්‍ය සමාගමක ලක්ෂණ

සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති සීමිත පොදු සමාගමක් වීම.

සමාගමේ මුළු ප්‍රාග්ධනයෙන් 51% ක ට වඩා වැඩි ප්‍රමාණයක් රජය හෝ රජයේ ආයතන සතු වීම.

නිද: ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම

සී/ස ලිට්‍රෝ ගෑස් සමාගම

ශ්‍රී ලංකා රක්ෂණ සමාගම

## පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාර වල ලක්ෂණ

- පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා යටතේ පවත්වා ගෙන යාම.
- අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම.
- අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතන විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම.
- පරිපාලනය පළාත් පාලන අධිකාරිය විසින් සිදු කිරීම.

2019 AL

1. රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
2. රාජ්‍ය සංස්ථාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් වෙන් කර හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න.

2018 AL

3. ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග හතරක් නම් කරන්න.